Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# සමාජජාල වෙබ් අඩවි සහ තරුණ පරපුරේ දේශපාලන චින්තනය. (ෆේස්බුක් සමාජ ජාලයට විශේෂිතව)

***ඩබ්.එම්.සී. සුපුන් බණ්ඩාර[1]***


සංක්ෂේපය

සමාජජාල වෙබ් අඩවි අද ලෝකය පුරා ම ව්‍යාප්ත වී ඇත. සමාජජාල වෙබ් අඩවියක් යනුවෙන් හැඳින්වෙන්නේ '' සම්බන්ධතා සහිත මිනිසුන් සමූහයකි ''. සරලව සමාජජාල යනු අන්තර්ජාලය හරහා මිනිසුන් සමූහයක් එක් වීමයි. (විදුදය වාණිජ්‍යය , 2011 ජූනි) මේවායේ ආරම්භය සිදුවුණේ 1990 දශකයේ අග භාගයේ දීයි. වර්තමානය වන විට ලොව පුරා ම බෙහෙවින්ම ජනප්‍රිය සමාජජාල වෙබ් අඩවියකි 2004 වර්ෂයේ ආරම්භ වූ ෆේස්බුක් සමාජ ජාලය. මෙය විවිධ අරමුණු වෙනුවෙන් භාවිත කරනු දැකිය හැක. ඒ අතරින් දේශපාලන කටයුතු මූලික ස්ථානයක් ගනී. වර්තමානය වන විට ලෝකයේ සෑම දේශපාලන පක්ෂයක් ම සහ දේශපාලඥයෙකු ම පාහේ ෆේස්බුක් ගිණුමක් පවත්වාගෙන යනු ලබයි. එමෙන් ම විශාල පිරිසක් එම ෆේස්බුක් පිටු නැරඹීම , ඒවාට කැමැත්ත පළකිරීම , එම පිටුවල ඇති දේ හුවමාරු කිරීම ආදිය දැක ගත හැක. ශ්‍රී ලංකාවේ ද එම ප්‍රවණතාවය එලෙසින්ම දැකගත හැකි අතර සියලු ම දේශපාලන පක්ෂ සහ දේශපාලඥයින් සිය ප්‍රචාරණ කටයුතු සඳහා ෆේස්බුක් පිටුවක් පවත්වාගෙන යනු ලබයි. එම ෆේස්බුක් පිටු තරුණ ප්‍රජාවගේ දේශපාලන මතය සැකසීමට බලපෑම් කරන බවට සමාජය තුළ කතිකාවක් නිර්මාණය වී තිබේ. එබැවින් මෙම අධ්‍යයනය තුළ සාකච්ඡාවට බඳුන් වන්නේ සමාජජාල වෙබ් අඩවි තරුණ පරපුරේ දේශපාලන චින්තනය සැකසීමට සිදු කරන්නාවූ බලපෑම පිළිබඳවයි. (ෆේස්බුක් සමාජජාලයට විශේෂිතව)

ෆේස්බුක් ගිණුම් හිමි බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක තුන තුළ ජීවත්වන අවුරුදු 24 - 35 වයස් කාණ්ඩ නියෝජනය කරන පුද්ගලයන් 100 දෙනෙකුට ජනගහන අනුපාතය සැලකිල්ලට ගනමින් ලබාදුන් ප්‍රශ්නාවලි මඟින් මෙම අධ්‍යයනය සිදු කරන ලදි. එම පුද්ගලයන් පසුගිය මහමැතිවරණයේ දී ඡන්දය භාවිත කළ අයයි. ඒ අනුව මෙම පර්යේෂණයේ දී දත්ත ලබා ගැනීම සඳහා ප්‍රමාණාත්මක ක්‍රමවේදය යොදා ගන්නා ලදි.

ලබාගත් දත්ත විශ්ලේශනය කිරීමෙන් අනතුරුව පර්යේෂණය අවසානයේ දී නිගමනය වූයේ දේශපාලන ෆේස්බුක් පිටු තරුණ ප්‍රජාවගේ දේශපාලන මතය සැකසීමට බලපෑම් කරන බවයි. දේශපාලනික කටයුතු සඳහා ෆේස්බුක් යොදාගැනීම ජනප්‍රිය වී ඇත්තේ යම් සන්දේශයක් ග්‍රාහකගත කිරීමට එහි ඇති සාර්ථකභාවය නිසාවෙනි. එහි ඇති ප්‍රතිපෝෂණ ගුණය , එහි ඇති ආකර්ෂණීයබව , පහසුවෙන් පරිහණය කළ හැකි වීම ආදිය එහි සාර්ථකත්වයට හේතු වේ.


ප්‍රමුක පද; ෆේස්බුක් ගිණුම්, සමාජජාල වෙබ් අඩවි

*1 ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැළණිය විශ්වවිද්‍යාලය*